# හුළංදා ඔය නිම්නයේ ග්‍රාමීය ස්තූප ව්‍යාප්තිය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**ඒ.කේ.පී.කේ. ලක්මාල්**
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.
lakmal12443@gmail.com

ප්‍රමුඛ පද: රජරට ශිෂ්ටාචාරය, ග්‍රාමීය ස්තූප ව්‍යාප්තිය, ජාතික ඉතිහාසය

**හැඳින්වීම**

රජරට ශිෂ්ටාචාරයට සාපේක්ෂ ව රෝහණ දේශය ද බෞද්ධාගමික ගොඩනැගිලි බොහෝ ප්‍රමාණයක් ව්‍යාප්ත භූමි ප්‍රදේශයකි. අතීතයේ සිට රෝහණය පාලනය කළ පාලකයන් බුදුදහමේ චිරස්ථිතිය උදෙසා ක්‍රියා කළ ආකාරය පැහැදිලි වන්නේ රෝහණ දේශය පුරාව්‍යාප්ත බෞද්ධාගමික ගොඩනැගිලි මගින් ය. අනුරාධපුර දෙවන පැතිස්රාජ්‍ය කාලය තුළ රෝහණයට පලා ආ උපරාජ මහානාගගෙන් ආරම්භ වන රෝහණ

> **" යුවරජ තෙමේ එයින්ම ඇදතොවුරන්හා බල වාහන සමඟ සිය දේහය රක්නට රුහුණ බලා ගියේ ය" (මහාවංශය 2003, 22 පරි. 6-7).**

රාජ පෙළපත රජරටට එල්ල වන ආක්‍රමණ පලවා හැරීමට මෙන් ම භික්ෂු ශාසනයේ ඉදිරි ගමන වෙනුවෙන් එකල පාලකයෝ ක්‍රියා කළහ. රාජ්‍ය අනුග්‍රහය මගින් විශාල බෞද්ධාගමික ගොඩනැගිලි ඉදිකිරීම හා මහාමාත්‍යයන්ගේ අනුදැනුම ඇති ව ග්‍රාමීය බෞද්ධ ගොඩනැගිලි ඉදිකරන්නට ඇතැයි නිගමනය කළ හැකි ය.

අතීතයේ පටන් හුළංදාඔය නිම්නය ස්ථානගත ව පැවතීම හා බෞද්ධාගමික ගොඩනැගිලි එම දෙපස ව්‍යාප්ත ව පවතින්නට ඇතැයි අනුමාණ කළ හැකි ය. වර්තමානය තුළ දක්නට ලැබෙන්නේ විනාශයට පත් වූ ගොඩනැගිලි පමණි. හුළංදාඔය සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් භූමි ප්‍රදේශයක පිහිටා ඇත. හුළංදාඔය අතීතයේ වළවේ නදිය පෝෂණය කිරීමට එකතු වූ නමුත් වර්තමානයේ ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැවට ජලය සපයන ගංගාවක් වේ. මෙම නිම්න ප්‍රදේශ තුළ පිහිටි ඇඹිලිපිටිය නගරය ජනාකීර්ණ ප්‍රදේශයක් වන අතර සෙසු නිම්න ප්‍රදේශ තුළ ග්‍රාමීය ස්තූප විශාල ප්‍රමාණයක් ස්ථානගත ව පවතී. නටඹුන් ව පවතින ස්තූප සියල්ල ම කුඩා ප්‍රමාණයේ ඒවා වේ. ඇඹිලිපිටිය කාවන්තිස්ස විහාරය, පනාමුර කාවන්තිස්ස විහාරය යන විහාර නටඹුන් ව පවතින ස්තූප, ගල් කණු, බුදුපිළිම, දක්නට ඇතිමුත් මෙම විහාර දෙකෙහි ම පැරණි ස්තූපය ආවරණය

වන ලෙස වර්තමානයේ ස්තූප ඉදිකර ඇත.

ඇඹිලිපිටියේ කාවන්තිස්ස විහාරය මාගම රාජධානියේ ආරම්භ වූ බවත්, කාවන්තිස්ස රාජ නියෝගය මත ඇමතිවරයෙකු විසින් එම ප්‍රදේශ ගොවි කර්මාන්තය සඳහා වැවක් බන්දවා වැවෙහි නැගෙනහිර හා බස්නාහිර දාගැබ් ඉදිකළ බවයි (ඤාණවිමල හිමි, 1967,297-298). පනාමුර කාවන්තිස්ස විහාරය පිළිබඳ සඳහන් වන්නේ රුහුණ රාජධානියක් වශයෙන් පැවති සමයෙහි විශාල දියුණුවකින් අනූන වූ මේ නගර මධ්‍යයේ විශාල වැවක් බැඳ එහි සිව් දිග දාගැබ් සතරක් තනවා තිබුණ බැව් පෙනේ (ඤාණවිමල හිමි, 1942,282). උක්ත සාහිත්‍ය මූලාශ්‍ර තුළ ද මෙම ප්‍රදේශයේ ව්‍යාප්ත ස්තූප පිළිබඳ සඳහන් ව ඇත. එම ස්තූප වලට අමතර ව තවත් බොහෝ ස්තූප ප්‍රමාණයක් නිම්න ප්‍රදේශ තුළ ව්‍යාප්තව ඇත. උදාහරණ ලෙස වෙහෙර ගොඩැල්ල, පින්හේන, ලේල්ලවල විහාරය, 3 කණුව ආරණ්‍ය සේනාසනය, ගල්අමුණ, යොවුන් ගම්මානය 2 කණුවඅසල පිහිටි ස්තූප දැක්විය හැකිය.

ඉහත සඳහන් වන්නේ ග්‍රාමීය ස්තූප ව්‍යාප්ත ව පවතින ප්‍රදේශ කිහිපයක් පමණි. මේවා සියල්ල ම නිදන් හොරුන්ගේ ග්‍රහණයට නතුව පවතින අතර, වර්තමානයේ දක්නට ලැබෙන්නේ පස් ගොඩැලිපමණි. එම ස්තූප අවට ගඩොල් කැබලි, ගල්කණු සහ ගල්ලැලි ස්තූප කිහිපයක් හඳුනා ගත හැකි ය. ඒවා නිරීක්ෂණය කළ විට පැහැදිළි වන්නේ අනුරාධපුර යුගයේ මුල්කාලයට අයත් ස්තූප එම නිම්නය අවට ව්‍යාප්ත ව පවතින බවයි.

ස්තූපය යන්න සිංහල බසින් හඳුන්වන්නේ තුබ හෝ තුඹ යනුවෙනි. එය සිංහලයට වඩාත් හුරුව ඇත්තේ දාගැබ නමිනි. එහි අරුත ධාතු ගර්භය යන්නයි. ස්තූප යන වචනය සංස්කෘතික වචනයකි. පාලි භාෂාවේ ථූප යනුවෙන් හඳුන්වන අතර සෑය, චෛත්‍යය යන නම් වලින් හඳුන්වන්නේ ද මෙම දාගැබයි. ස්තූප අනෙක් රටවලට වඩා වැඩි වශයෙන් මුල්බැස ගත්තේ ශ්‍රී ලංකාවේ ය. ඇතැම් උගතුන් ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතියේ එක් පැතිකඩක් තේරුම් කර දෙන්නේ ද ස්තූප යොදා ගැනීමෙනි. "ගමයි පන්සලයි වැවය දාගැබයි" යන සුලබ යෙදුමෙන් කියවෙන්නේ එයයි. මෙම බෞද්ධ සංස්කෘතිය බෙහෙවින් තේරුම් ගත හැකිවන්නේ හුළංදාඔය නිම්නය පවතින ස්තූප අධ්‍යයනය කරන විට ය.

හුළංදා ඔය නිම්නයේ පුරාවිද්‍යාත්මක අවශේෂ ව්‍යාප්තියට බලපාන හේතු කවරේ ද? යන අධ්‍යයන ගැටලුව මූලික කරගෙන අධ්‍යයනය සිදුකරන ලදී.

- ජාතික ඉතිහාසයට ප්‍රාදේශීය ඉතිහාසය එක් කිරීමේ සංකල්පය උදෙසා අධ්‍යයනය සිදුකරන ලදී
- රෝහණ දේශයේ ප්‍රධාන පුරාවිද්‍යාත්මක උරුමයන් ඇදි

පුරවරයක් ලෙස හදුන්වා දීම සදහා

- සාහිත්‍ය මූලාශ්‍ර වල යම්පමණින් කරුණු සදහන් වුව ද සෙසු පුරාවිද්‍යා ස්මාරක කෙරෙහි අවධානය යොමු නොකිරීම
- හුළංදා ඔය නිම්න කෙරෙහි විද්වතුන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු කරවීම

යන කරුණු මූලික අරමුණු ලෙස හඳුන්වා දිය හැකි අතර ගැටලුවට අදාළ කරුණු එක්රැස් කිරීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සදහා පර්යේෂණය සිදුකරන ලදී.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා දත්ත හා තොරතුරු එක්රැස් කිරීමේ දී මූලාශ්‍ර අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යයනය යන කරුණු කෙරෙහි අවධානය යොමුකරන ලදී. මූලාශ්‍ර පරිශීලනයේ දි ප්‍රාථමික මෙන්ම ද්විතික මූලාශ්‍ර යොදාගන්නා ලදි. එහි දී අදාළ ප්‍රදේශය සම්බන්ධ මූලාශ්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ද විශේෂ වේ. හුළංදා ඔය නිම්න ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක දත්ත රැස්කිරීමෙන් හා විග්‍රහ කිරීමෙන් සාහිත්‍යමය මූලාශ්‍ර වලින් දැක්වෙන කරුණු වල විශ්වසනීයත්වය උරගාබැලීම සදහා අනුගමනය කිරීමට අපේක්ෂා කරන විධික්‍රම පහත පරිදි වේ.

ප්‍රධාන වශයෙන් හුළංදාඔය නිම්නයේ ස්තූප ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කරන හෙයින් ක්ෂේත්‍ර පර්යේෂණ ඔස්සේ දත්ත රැස්කිරීම මූලික වේ. ප්‍රාථමික දත්ත එහි වර්තමානයේ ජීවත්වන පුද්ගලයන් සමග සම්මුඛ සාකච්ඡා මගින් ලබාගැනීමට කටයුතු කළහ. ප්‍රදේශය පිළිබඳ පාරම්පරික කතා, ජනප්‍රවාද අධ්‍යයනය කිරීමෙන් ද දේශපාලනික ඉතිහාසය විමර්ශනය කිරීමට පුස්තකාල පර්යේෂණ ඇසුරින් ද දත්ත රැස්කිරීමට පියවර ගත්හ. ස්තූප ව්‍යාප්තිය පිළිබඳ දත්ත රැස්කිරීම පිණිස ක්ෂේත්‍ර ඇවිදීම (Field Walking) යනාදි ක්‍රමවේදය භාවිත කරන ලදී. අධ්‍යයන සීමා පිළිබඳ ව සදහන් කළහොත් හුළංදා ඔය මධ්‍ය හා පහළ නිම්නයට සීමාවීම සහ එම නිම්න දෙපසට කිලෝමීටර් 10ක පමණ සීමාව තුළ පවතින ස්තූප අධ්‍යනයට ලක් කිරීම විශේෂ වේ.

**ප්‍රතිඵල හාසාකච්ඡාව**

අධ්‍යයන ප්‍රදේශය තුළ ව්‍යාප්ත ස්තූප බොහෝ ප්‍රමාණයක් පවතින අතර දේශපාලනික වශයෙන් ඒවා ප්‍රාදේශීය පාලකයන් ඉදිකළ බව ජනප්‍රවාද වලින් පැහැදිළි වේ. රජරට රාජධානියට සාපේක්ෂව රෝහණ දේශය විශාල භූමි ප්‍රදේශයක් වීමත්, එම ප්‍රදේශයෙහි බෞද්ධාගමික ගොඩනැගිලි නිර්මාණය බහුල වශයෙන් හඳුනාගත හැකි ය. අතීත පාලකයන් යුධ ක්‍රියාමාර්ග කෙරෙහි යොමු වූයේ සතුරන් පලවා හැරීමට මිස බුදුදහම විනාශ කිරීමට නොව, එමගින් බුද්ධ ශාසනය මතු පරපුරට ආරක්ෂා කරදීම සඳහා ය. එසේ ක්‍රියා කළ ආකාරය ශේෂ ව පවතින පුරාවිද්‍යාත්මක අවශේෂ ඔස්සේ නිගමනය විය. මෙම අධ්‍යයනය තුළින් රෝහණ දේශයට අයත්,

ගවේෂණය නොකළ ප්‍රදේශයන්හි බෞද්ධාගමික ස්මාරක ව්‍යාප්තිය හඳුනාගන්නා ලදී. සාහිත්‍ය මූලාශ්‍ර වල සඳහන් නොවන ස්මාරක කිහිපයක් පිළිබඳ තොරතුරු ගවේෂණය තුළින් ලබාගත් ප්‍රතිඵල ලෙස හඳුන්වා දිය හැකි ය. රෝහණ දේශයේ පාලනය ගෙන ගිය රජවරු සෑම ප්‍රදේශයක් ම සශ්‍රීක කිරීමට මෙන්ම මිනිසුන් බෞද්ධාගම කෙරෙහි නැඹුරු කිරීමට ද පියවර ගත් බව පැහැදිලි ය. ස්මාරක (ස්තූප) කිහිපයක් වෙත ළඟා වීමට නොහැකි වූයේ ප්‍රදේශවාසීන්ගේ බලපෑම් හේතුවෙන් බව සඳහන් කළ යුතු ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


මහාවංශය (2003), විමලජෝති හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල

පරණවිතාන, ඇස් (1995), ලංකාවේ ස්තූපය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව, කොළඹ.

ඥාණවිමල, කිරිඇල්ලේ (1967), සබරගමු දර්ශන, ශාසෙත්‍රාදය යනත්‍රාලය, රත්නපුර.

ඥාණවිමල, කිරිඇල්ලේ (1942), සබරගමුවේ පැරණි ලියවිලි, මානව හිතවාදී ලේඛක පර්ෂදය, නුගේගොඩ.